# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2181/17 - 2020 ජුනි මස 24 වැනි බදාදා - 2020.06.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව පිහිටුවීම**

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ “සෞභාග්‍යයේ දැක්ම” සංකල්පය ප්‍රකාරව දරිද්‍රතාවයෙන් පෙළෙන ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ආර්ථික තත්ත්වය නගාසිටුවීමේ අරමුණින් අවම අධ්‍යාපන සුදුසුකම් ඇති, අඩු ආදායම්ලාභී, දුප්පතුන් අතර දුප්පතුන් වූ ශ්‍රී ලාංකික පුරවැසියන් 100,000ක් දෙනා විධිමත් වෘත්තීය පුහුණුව තුළින් ආර්ථික ඵලදායී නව ශ්‍රම බලකායක් වශයෙන් ගොඩනැගීම සඳහා එතුමන් විසින් අංක PS/SP/Sec./Cab.P හා 2019 දෙසැම්බර් මස 09 වන දිනැතිව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සටහන මත පදනම්ව නිකුත් කර ඇති අංක අමප/19/3388/201/004 දරන 2019 දෙසැම්බර් මස 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් **“බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව”** වර්ෂ 2020ක් වූ ජනවාරි මස 15 වන දින ආරක්ෂක අමාත්‍යාංශයීය විෂය පථය යටතේ ස්ථාපනය කර මෙහෙයුම් කටයුතු ආරම්භ කළ බවට මෙයින් සියලු ජනතාව වෙත නිවේදනය කරනු ලැබේ.

**ශ්‍රම දායකයන් විසින් සපුරාලනු ලබන ප්‍රමුඛ කාර්යයන්**

1. රාජ්‍ය දේපළ නඩත්තුව සහ සිවිල් කාර්යයන් සඳහා රාජ්‍ය නියෝජිතායතනයන්ට සහාය වීම.
2. මුර කටයුතු සහ නඩත්තු සහ සෙසු කාර්යයන්හිදී පාසල් සහ රෝහල් වලට සහාය වීම.
3. ඩෙංගු හා අනෙකුත් බෝවන රෝග මර්ධන වැඩසටහන් හා පරිසර පවිත්‍ර කිරීමේ වැඩසටහන් වලට සහාය කරගැනීම.
4. වනජීවී තර්ජනයන් පවත්නා ග්‍රාම ප්‍රදේශයන්, දේපළ, ගොවිජන සේවා සම්පත් සහ ජීවනෝපායන් ආදිය සුරැකීම සඳහා සහාය බලකායක් වශයෙන් ක්‍රියාකිරීම.
5. ස්වභාවික ව්‍යවසනයන් අවම කරලීමේ ක්‍රියාකාරකම් වලදී සහාය වීම.
6. වන වියන සංවර්ධනය සහ ස්වභාවික පරිසරය සංරක්ෂණයේදී සහාය වීම.
7. ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය, ආහාර ගබඩාකරණය, බෙදාහැරීම සහ සැපයුම් සේවාවන්හිදී සහාය වීම.
8. ගෙවතු වගාවන්, ගොවිපළ සහ අනෙකුත් ජීවනෝපාය සංවර්ධන කටයුතු, නිවාස සහ සනීපාරක්ෂක කටයුතු වැඩි දියුණු කිරීම් වලදී ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්ක කරගත් දිවිනැගුම පවුල් 100,000ක් සඳහා සහාය වීම.

9. කෘෂි ගොවිපළ වගාවන්, ඉඩම් සැකසුම් සහ භූමි අලංකරණය සහ අතුරු කොන්ත්‍රාත් ආදී කටයුතු වලදී සිවිල් කාර්යයන් ඉටු කරලීම.
10. වෙරළ සංරක්ෂණ වැඩ සටහන් වලදී සහාය වීම
11. ප්‍රජා ආරක්ෂාව සැපයීම පිණිස ආරක්ෂක හමුදාවන්ට හා පොලිස් සේවයට ආධාර උපකාර කරලීම සඳහා පරිපූරක සිවිල් බලකායක් ලෙසින් සහාය වීම
12. වානිජ පදනමෙන් කෘෂි ගොවිපළ කළමනාකරණය ඉටු කරලීම.
13. විදෙස් ශ්‍රම උපයෝජනය අවම කරලනු පිණිස ඉදිකිරීම් කටයුතු වලදී ශ්‍රම සම්පත් සපයාලීම.
14. විෂය භාර අමාත්‍යවරයා හෝ රජය විසින් නියම කරනු ලබන විශේෂ කාර්යයන්හි නියැලීම.

*ලිපිනය*

අධ්‍යක්ෂ ජනරාල්,
බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව,
අංක 17,
වැතම් වීදිය,
කොළඹ 01.

අමාත්‍ය මණ්ඩලයේ අණ පරිදි,

ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2020 ජුනි මස 23 වැනි දින.

07-266

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.